# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1719/32 - 2011 අගෝස්තු 18 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත

10 වැනි වගන්තිය යටතේ නිවේදනය

කාර්මික ආරවුල් පනතේ 10 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පහත දක්වා ඇති නියෝගය කිරීම සඳහා වූ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ අදහස කම්කරු කොමසාරිස් වී. බී. පී. කේ. වීරසිංහ වන මම, එකී පනතේ 10 වැනි වගන්තියේ (4) උප වගන්තියේ (අ) ඡේදය යටතේ මෙයින් නිවේදනය කරමි.

එකී යෝජිත නියෝගයෙන් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙක් වන්නේ නම් ඒ පිළිබඳ විරෝධතා 2011 සැප්තැම්බර් මස 15 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලිඛිතව ඉදිරිපත් කළ හැකිය.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**10 වැනි වගන්තියේ 2 උපවගන්තිය යටතේ යෝජිත නියෝගය**

මෙහි සේවායෝජකයා ලෙස හැඳින්වෙන, උපලේඛනයේ නම් සඳහන් සාමාජික සමාගම් ඇතුළත් වන හා තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තය සහ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තය සඳහා ස්ථාපිත පඩි පාලක සභාවලින් ආවරණය වන ලංකා සේවා‍ය සම්මේලනයත් අනෙක් අතට සංගම් ලෙස හැඳින්වෙන ලංකා කම්කරු කොන්ග්‍රසය, ලංකා ජාතික වතු කම්කරු සංගමය සහ ඒකාබද්ධ වැවිලි කර්මාන්ත සංගම් මධ්‍යස්ථානය අතර 2011 ජූනි මස 06 වැනි දින ඇති කර ගන්නා ලද හා 2011 ජූනි මස 16 වැනි දින අංක 1710/14 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද "2011 අංක 22 දරන සාමූහික ගිවිසුම" යටතේ ප්‍රකාශයට පත් කරන ලද කොන්දේසි හා නියමයන්, ඉහත කී පඩි පාලක සභාවලින් ආවරණය වන ශ්‍රී ලංකාවේ සෑම සේවායෝජකයෙකුගෙන් යමෙකුට බල නොපැවැත්වේ නම්, ඒ හැම සේවායෝජකයෙකු ම එම සාමූහික ගිවිසුමෙන් පිළිගත් කොන්දේසිවලට හා නියමයන්ට යම් සේ සුළු කොට නොසලකෙන අන්දමේ කොන්දේසි පිළිපැදිය යුතු ය.

1A - G 14951— 340 (2011/08)

*උපලේඛනය*

1. අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
2. ආගරපතන ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
3. බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
4. බගවන්තලාව ටී ස්ටේට් පීඑල්සී
5. ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්
6. ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
7. හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
8. හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
9. කහවත්ත ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
10. කෑගල්ල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
11. කැළණිවැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
12. කොටගල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
13. මඩොල්සිම ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
14. මල්වත්ත වැලී ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
15. මස්කෙළිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
16. මතුරට ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
17. නමුණුකුළ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
18. පුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්
19. තලවකැලේ ටී එස්ටේට් පීඑල්සී
20. උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
21. වටවල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
22. ශ්‍රී ලංකා එස්ටේට් ප්ලාන්ටේෂන්ස් කෝපරේෂන්
23. ජනතා එස්ටේට් ඩිවලප්මන්ට් බෝර්ඩ්

08-98

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.